රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 6/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
1988 පෙබරවාරි මස 11 වැනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**අධිකරණ නිලධරයන්/රජයේ නිලධරයන්/රාජ්‍ය සංස්ථා සේවකයින් රජයේ වාහන පාවිච්චි කිරීම.**

1984.08.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:264 ට වැඩිමනත් වශයෙනි.

02. මසකට රු. 150/= ක ගෙවීමක් මත, රජයට පවරාගත් ව්‍යාපාර ආයතනයක සිටි බලධරයෙකුට පෞද්ගලික කාර්යයන් සඳහා රජයේ වාහනයක් පාවිච්චි කිරීමට අවසර දෙනු ලැබේ.

03. නිරතුරුවම සාමාන්‍ය රාජකාරි වේලාවන්ට බොහෝ සෙයින් පිටස්තරව රාජකාරි කිරීමට අවශ්‍ය වන, සාධාරණ ගමන් දුර සීමාවක් තුළ තම නිවස පිහිටා ඇති පහත සඳහන් නිලධාරීන්ට තම නිවස හා රාජකාරි ස්ථානය අතර රජයේ වාහනයකින් ගමන් කිරීමට අවසර දෙනු ලැබේ.

"අධ්‍යක්ෂවරයෙකු" වශයෙන් නම් කොකරන ලද රජයේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියෙක්.

1984.08.15 දිනැති හා අංක: 264 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය යටතේ තම නිවස හා රාජකාරි ස්ථානය අතර ගමන් කිරීම සඳහාද, මසකට රු.100/= ක ගෙවීමක් මත මසකට සැතපුම් 600 ක් හෝ ඉන්ධන ගැලුම් 24 ක ප්‍රතිපාදනයක් හෝ වන උපරිමයකට යටත්ව, පෞද්ගලික කාර්යයන් සඳහාද, රජයේ වාහනයක් පාවිච්චි කිරීමට දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අවසර දී ඇති අවස්ථාවකදී එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂවරයෙක්.

රජයේ සංස්ථාවක එක් සාමාන්‍යාධිකාරීවරයෙක් පමණක්.

04. පෞද්ගලික කාර්යයන් සඳහා රජයේ වාහනයක් පාවිච්චි කිරීමට අවසර දී ඇති රජයේ රජයේ නිලධරයෙකු/සංස්ථා සේවකයෙකු හට එසේ පෞද්ගලික කාර්යයන් සඳහා යාමේදී එම වාහනය පැදවීමට අවසර දිය හැකි අතර, නිලධාරියාගේ කැමැත්ත පරිදි නිල ගමන් සඳහා ද එම අවසරය දීර්ඝ කළ හැක.

05. පෞද්ගලික පාවිච්චිය සඳහා මුදා හැර ඇති රජයේ වාහන රජය මඟින් ගෙවනු ලබන සර්වාංගී ආරක්ෂණ සහතික පත්‍රයක් මඟින් ආවරණය විය යුතුය.

06. පෞද්ගලික වාහනය සඳහා රජයේ වාහනයක් පාවිච්චි කරන රජයේ නිලධරයෙකුට/ රාජ්‍ය සංස්ථා සේවකයෙකුට එම වාහනය තම නිවසේ නතර කර තබා ගැනීමට අවසර දිය හැක.

07. මෙම විධිවිධාන 1988.01.16 දින සිට ක්‍රියාත්මක වේ.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)

ලේකම්,

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.